# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1715/11 – 2011 ජූලි 20 වැනි බදාදා – 2011.07.20**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ යොමු අංකය: IR/22/86/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එච්. ඒ. ඩී. චන්ද්‍රසිරි මයා, අංක 36, ඇටම්පිටිය පාර, බදුල්ල.

සහ

ඌව සංවර්ධන බැංකුව, අංක 26, බැංකු පාර, බදුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

මහනුවර, වටපුළුව, ජය මාවත, අංක 53 හි කේ. ආර්. එම්. එන් . ලෝරන්ස් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 ජූලි මස 15 වැනි දින,
කොළඹ දී ය.

1A – G 014807 – 380 (2011/07)

මගේ යොමු අංකය: IR/22/86/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්. ඒ. ඩී. චන්ද්‍රසිරි මයා, අංක 36, ඇටම්පිටිය පාර, බදුල්ල.

සහ

ඌව සංවර්ධන බැංකුව, අංක 26, බැංකු පාර, බදුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

ඌව සංවර්ධන බැංකුව යටතේ පාලනය වන හල්දුම්මුල්ල ශාඛාවේ කළමනාකරු වශයෙන් සේවයෙහි යෙදී සිටියදී එච්. ඒ. ඩී. චන්ද්‍රසිරි මහතා විසින් සිදු කර ඇතැයි කියනු ලබන වැරදි සම්බන්ධයෙන් එම බැංකුවේ සාමාන්‍යාධිකාරී විසින් ඔහු වෙත නිකුත් කරනු ලැබූ 2007.04.27 දිනැති අභ්‍යන්තර ලිපිය මගින් දඬුවම් පැමිණ වීම යුක්ති සහගතද යන්න හා යුක්ති සහගත නොවන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2011 මැයි මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08 - 74

---

මගේ යොමු අංකය: IR/22/69/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්,

(1) ආර්. එම්. එන්. රාජපක්ෂ මහතා, අංක 383, අග්‍රබෝධි මාවත, කන්තලේ සහ
(2) එන්. ජී. ප්‍රේමසිරි මහතා, අංක 43/50, ප්‍රියන්ත මාවත, කන්තලේ.

සහ

අනෙක් පාර්ශ්වයක් වශයෙන්,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

කොළඹ 08, මාතා පාර, මැනිං ටවුන් නිවාස යෝජනා ක්‍රමය, අංක බී 9 හි එන්. ඒ. ජයවික්‍රම මහත්මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 ජූලි මස 15 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/22/69/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

(1) ආර්. එම්. එන්. රාජපක්ෂ මහතා, අංක 383, අග්‍රබෝධි මාවත, කන්තලේ සහ (2) එන්. ජී. ප්‍රේමසිරි මහතා, අංක 43/50, ප්‍රියන්ත මාවත, කන්තලේ.

සහ

අනෙක් පාර්ශ්වයක් වශයෙන්,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ පාලනය වන කන්තලේ ඩිපෝවේ සේවය කරමින් සිටියදී 2007.04.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ තහනම් කරනු ලැබූ එහි වැඩ නායක ආර්. එම්. එන්. රාජපක්ෂ හා රියදුරු එන්. ජී. ප්‍රේමසිරි යන අය සම්බන්ධයෙන් එම මණ්ඩලයේ නැගෙනහිර ප්‍රාදේශිකය කල්මුනේ අභියාචනා මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ 2007.11.23 දිනැති අභියාචනා නියෝගය ප්‍රකාරව ඔවුන්ගේ වැඩ තහනම් කර තිබූ කාලසීමාව සඳහා හිඟ වේතන ලබා නොදීම හේතුවෙන් ඔවුන්ට යම් අසාධාරණයක් වූයේද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2011 මැයි මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08 - 75

---

මගේ යොමු අංකය: IR/10/14/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම.

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියැවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2010 නොවැම්බර් මස 22 වැනි දින අංක 1681/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2010 නොවැම්බර් මස 10 වැනි දින දරන නියෝගයෙන්,

ඩී. පී. ඩී. වික්‍රමආරච්චි මහතා, අංක 287, රනවන, කටුගස්තොට

හා

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර පවත්නා 2010 සැප්තැම්බර් මස 06 වන දින දරන කාර්මික ආරාවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කීර්ති සිගේරා මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2010 නොවැම්බර් මස 10 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 ජුලි මස 15 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/10/14/2009.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ඩී. පී. ඩී. වික්‍රමආරච්චි මහතා, අංක 287, රනවන, කටුගස්තොට

හා

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

දෙහිවල, රෝහල පාර, නො. 47/1 හි එම්. ආරිෆ් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 ජුලි මස 15 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/10/14/2009.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

ඩී. පී. ඩී. වික්‍රමආරච්චි මහතා, අංක 287, රනවන, කටුගස්තොට

හා

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ .

ලංකා විදුලිබල මණ්ඩලයේ රියදුරෙකු වශයෙන් සේවය කර 2003.12.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් විශ්‍රාම ගන්වනු ලැබූ ඩී. පී. ඩී. වික්‍රමආරච්චි මහතා විදුලිබල මණ්ඩලීය විශ්‍රාම වැටුප් අරමුදල ප්‍රකාරව විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ලබන්නේද යන්න හා නොඑසේනම් ඔහුට හිමිවිය යුතු වෙනත් සහනයන් මොනවාද යන්න පිලිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2011 ජුනි මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදි දින යොදන ලදී.

08 - 76

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.